සංශෝධනයයි

**ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020**

අංක 2193 දරන 2020 සැප්තැම්බර් මස 11 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ''ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය - 2020'' විභාග නිවේදනයෙහි 02(අ) යටතේ සඳහන් විෂය නිර්දේශය පහත පරිදි සංශෝධනය විය යුතුය. :-

| | *ප්‍රශ්න පත්‍රයේ නම* | *කාලය (පැය)* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1 | අවබෝධය | 02 | 100 | 40 |
| 2 | බුද්ධි පරීක්ෂණය | 01 | 100 | 40 |
| 3 | සාමාන්‍ය දැනීම | 01 | 100 | 40 |

*01. අවබෝධය :*

පැය දෙක (02)ක කාල සීමාවකට සීමාවන මෙම ප්‍රශ්න පත්‍ර මගින් කෙටි පාඨ ගණනාවක් අයදුම්කරුවන් වෙත දෙනු ලැබේ. ඇතැම් පාඨ දෙනු ලබන්නේ එක් වාක්‍යයකින් අදහස් ප්‍රකාශ කිරීම පිණිස වේ. යටින් ඉරි ඇඳි පදවලට විවරණ සැපයීමේ ප්‍රශ්න ද දෙනු ලැබේ. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අයදුම්කරුවන් වෙත විකල්ප ප්‍රකාශ ගණනාවක් ඉදිරිපත් කරන අතර, එයින් එකක් මෙම පාඨයේ අන්තර්ගත කරුණුවලට වඩාත්ම හොඳින් ගැළපෙයි. අයදුම්කරුවන් මෙයින් වඩාත් උචිත ප්‍රකාශය තෝරාගත යුතුය. තවත් ඇතැම් පාඨ සම්බන්ධයෙන් අයදුම්කරු වෙත ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරනු ඇත. ඒවාට නිවැරදි පිළිතුරු ලබාදීම අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්න පිළියෙල කරනු ලබන්නේ අයදුම්කරු එම පාඨයන්ගේ අර්ථය වටහාගන්නා ආකාරය පරීක්ෂා කිරීම සඳහා ය. මෙයට අමතරව සාරාංශය ලිවීම සඳහා දිග පාඨයක් දෙනු ලැබේ.

*02. බුද්ධි පරීක්ෂණය :*

පැයක කාලසීමාවකට සීමාවන මෙය සකස් කර ඇත්තේ අයදුම්කරුගේ සිතීමේ තර්කානුකූල තත්ත්වයටත්, ඔහුගේ සිතෙහි විශ්ලේෂණ හැකියාවත්, ඔහුගේ තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා ය. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්වලින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

*03. සාමාන්‍ය දැනීම :*

පැයක කාල සීමාවකට සීමාවන මෙම ප්‍රශ්න පත්‍රය ශ්‍රී ලංකාවේ දේශපාලන, සමාජ, සංස්කෘතික, ආර්ථික හා පරිසරය ද ඇතුළුව සමස්තය පිළිබඳව සහ ජාතික හා අන්තර් ජාතික වැදගත්වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක, තාක්ෂණික හා කාර්මික සංවර්ධනය ද සම්බන්ධයෙන් ඇති දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ පොදු ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු වේ.

ඒ. එල්. ශ්‍යාමලී චිත්‍රලේඛා පෙරේරා,
සර්වේයර් ජනරාල්.

2020 නොවැම්බර් මස 30 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.